# HDFC BANK

දශක හතරක කාලයක් පුරා විවිධ මූල්‍ය විසඳුම් හරහා සුවහසක් ශ්‍රී ලාංකිකයන්ගේ  හිසට සෙවණක් මෙන්ම ව්‍යාපාරික ප්‍රජාවට මූල්‍ය සහාය සපයමින් දැයේ අභිවෘද්ධිය උදෙසා කැප වන බැංකුවක් සමඟ ඔබේ බැංකුකරණ වෘත්තීය උසස් තලයකට ගෙන ඒමට මහඟු අවස්ථාවක් උදා වී ඇත.

HDFC බැංකුවෙහි අනුකූලතා නිලධාරී තනතුර සඳහා දක්ෂ, ක්‍රියාශීලි සහ සුබවාදී දැක්මක් සහිත අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## අනුකූලතා නිලධාරී

**මූලික වගකීම්:**

- අනුගත විය යුතු අභ්‍යන්තර සහ බාහිර නීති, රෙගුලාසි, ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටිවලට බැංකුව අනුගත වන බව සහතික කිරීම සඳහා අවශ්‍ය විගණන කටයුතු සහ පරික්ෂා කිරීම් සිදු කිරීම.
- නියාමන අවශ්‍යතා සහ අනුකූලතා ප්‍රමිතිවලට අනුගත වන්නේද යන්න සොයා බැලීම සඳහා අවශ්‍ය සමාලෝචන නිසි කාල රාමුවලට අනුව සිදු වන බව සහතික කිරීම.
- බැංකුවේ කටයුතුවලට අදාළ සියලු නව නෛතික හා නියාමන තත්ත්ව අවබෝධ කර ගැනීම සහ ඒවා ක්‍රියාත්මක කිරීම.
- අනුකූලතා හා සම්බන්ධ ගැටලු සම්බන්ධයෙන් අදාළ පාර්ශව සම්බන්ධ කර ගැනීම සඳහා මැදිහත්කරුවකු ලෙස කටයුතු කිරීම.
- ව්‍යවස්ථාපිත මාර්ගෝපදේශ (ශ්‍රී ලංකා මහ බැංකුව, CSE, FIU සහ අනෙකුත් නියාමන ආයතන හඳුන්වා දුන්) ක්‍රියාත්මක කිරීම, භාවිත කිරීම, යාවත්කාලීන කිරීම සහ ආයතනය තුළ එවැනි මාර්ගෝපදේශ උල්ලංඝණය වීමක් සිදු නොවන බවට වග බලා ගැනීම.
- ශ්‍රී ලංකා මහ බැංකුව සමඟ කටයුතු කරමින් බැංකුවට අදාළ පාර්ශව සුරක්ෂිත කිරීම සඳහා කඩිනම් පියවර ගැනීම.

**අධ්‍යාපන සුදුසුකම්:**

- බැංකුකරණය / ව්‍යාපාර පරිපාලනය / මූල්‍යකරණය / ගිණුම්කරණය / ආර්ථික විද්‍යාව / නීතිය හෝ වෙනත් අදාළ ක්ෂේත්‍රයකට අදාළව පිළිගත් විශ්ව විද්‍යාලයකින් උපාධියක් ලබා තිබීම.
  **හෝ**
  ශ්‍රී ලංකා බැංකුකරණ ආයතනය (AIB) /ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනය (CASL) / වරලත් සහතිකලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනය (ACCA) / වරලත් කළමනාකාර ගණකාධිකාරිවරුන්ගේ ආයතනය (CIMA-UK) / සහතිකලත් කළමනාකාර ගණකාධිකාරිවරුන්ගේ ආයතනය (CMA) යන ආයතනවල සාමාජිකත්වය ලබා තිබීම. / නීතිඥ
- බැංකුකරණ නියාමන හා අනුකූලතා පිළිබඳ පළපුරුද්ද සුවිශේෂ වේ.

**පළපුරුද්ද:**

- කළමනාකාර හෝ ඊට ඉහළ මට්ටමේ අවම වශයෙන් වසර පහක් ඇතුළත් මූල්‍ය හෝ බැංකුකරණ ක්ෂේත්‍රයේ වසර 10ක පළපුරුද්ද සහ අනුකූලතා ක්‍රියාවලිය පිළිබඳ පළපුරුද්ද සහ පුළුල් දැනුම.
- නියාමන අනුකූලතා, ප්‍රති මුදල් විශුද්ධිකරණය, ආයතනික පරිපාලනය සහ සාරධර්ම පිළිබඳ පුළුල් දැනුම.

**වයස් සීමාව:** වයස අවුරුදු 50ට නොවැඩි විය යුතුය.

තෝරාගන්නා අයදුම්කරුට ආකර්ශණීය වැටුප් සහ දීමනා හිමි වේ

**අයදුම් කිරීමේ ක්‍රමවේදය**

විද්‍යුත් පණිවිඩයේ විෂය තීරයෙහි (**Subject**) ඉල්ලුම් කරන තනතුර සඳහන් කරමින් 2024.02.14 දින හෝ එදිනට පෙර තමා පිළිබඳ විස්තර ලබා ගත හැකි ඥාතීන් නොවන දෙදෙනෙකුද සඳහන් කරමින් ඔබගේ ඉල්ලුම් පත්‍රය careers@hdfc.lk යන විද්‍යුත් ලිපිනය වෙත යොමු කළ යුතුය.

අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය වන විට ඉල්ලා ඇති සුදුසුකම් සහ පළපුරුද්ද සපුරා නොමැති පුද්ගලයන්ට මෙම තනතුර සඳහා අයදුම් කළ නොහැක. අදාළ සුදුසුකම් සපුරා නොමැති පුද්ගලයන්ගේ අයදුම්පත් සහ අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පසුව ලැබුණු අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කෙරෙනු ඇත.

සම්මුඛ පරීක්ෂණයේදී අදාළ ලිපි ගොනුවල මුල් පිටපත් ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අයදුම්කරුවන් කිසිදු හේතුවක් මත මෙම තනතුර සඳහා පත් නොකෙරෙනු ඇත.

ඕනෑම ආකාරයක බලපෑම් කිරීමක් මෙම තනතුර සඳහා නුසුදුසුකමක් ලෙස සැළැකේ.

බඳවා ගැනීම් කල් දැමීමට හෝ අවලංගු කිරීමට HDFC බැංකුවට හැකියාවක් ඇත. තෝරා ගත් අයදුම්කරුවන් පමණක් බඳවා ගැනීමේ ක්‍රමවේදයේ ඉදිරි අදියර සඳහා කැඳවනු ඇත.


**සහකාර සාමාන්‍යධිකාරී - මානව සම්පත් හා පාලන**
**HDFC බැංකුව**
**තැ. පෙ. 2085**
**ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාර්ඩිනර් මාවත**
**කොළඹ 02**
**දුරකථන අංකය: 0112356800 වෙබ් අඩවිය: www.hdfc.lk**